**වර්ෂ 2022 ක් වූ දෙසැම්බර් මස 15 වන දින පෙ.ව 10.00 ට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ වාර්තාව**

පැමිණීම

01. ගරු සභාපති - ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
02. ගරු උප සභාපති - එච්.ඒ නන්දසෝම මහතා
03. ගරු මන්ත්‍රී - වී.මුරලිදරන් මහතා
04. ගරු මන්ත්‍රී - එච්.ජී මහින්ද ගුණසේකර මහතා
05. ගරු මන්ත්‍රී - ශාන්තලාල් පෙරේරා මහතා
06. ගරු මන්ත්‍රී - ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
07. ගරු මන්ත්‍රී - කේ.ඕ සෝමතිලක මහතා
08. ගරු මන්ත්‍රී - එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
09. ගරු මන්ත්‍රී - එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
10. ගරු මන්ත්‍රී - ජී.කේ.පී ෆොන්සේකා මිය
11. ගරු මන්ත්‍රී - ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
12. ගරු මන්ත්‍රී - එච්.ජී මෛත්‍රීපාල මහතා
13. ගරු මන්ත්‍රී - එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
14. ගරු මන්ත්‍රී - අයි.රාමකිලි මහතා
15. ගරු මන්ත්‍රී - ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
16. ගරු මන්ත්‍රී - එස්.එල්.අරුණ ශාන්ත මහතා
17. ගරු මන්ත්‍රී - එන්.එම් සුසිලා දමයන්ති මිය
18. ගරු මන්ත්‍රී - කේ.ඕ කුසුම්ලතා මිය

නොපැමිණීම

01. ගරු මන්ත්‍රී - පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි
02. ගරු මන්ත්‍රී - එච්.ඒ.එන්.සී රණසිංහ මහතා

**01. පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරීම**

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා

යථා පරිදි කල් දී ඇති යෝජනා හි 05-02 යෝජනාව වන ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කරන ලද 2022 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් රු. 100,000.00 ක මුදලක් දඩුබැදිරුප්ප කොට්ඨාශයට වීථි පහන් ලබා දීම සඳහා යෝජනා ස්ථිර වී තිබුණු අතර එම යෝජනාව වෙනස් කර පහත සඳහන් යෝජනා වෙනුවෙන් උක්ත මුදල වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි

1. උඩකටුකිතුල අමරසේන මහතාගේ නිවස අසලින් යන බෝක්කුව සහ දන්ගහදෙනිය බෝක්කුව යන බෝක්කු දෙක සංවර්ධනය කිරීම සඳහා කටුකිතුල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ප්‍රතිපාදන ලබා දීම
2. දඩුබැදිරුප්ප පහළ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දීම

යන යෝජනාව මා විසින් ස්ථිර කරන ලද බව වාර්තා වී තිබුණද එය මා විසින් ස්ථිර නොකළ බව ප්‍රකාශ කරන අතර එය සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරමි.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා විසින් ස්ථිර කරන ලද බවත් ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනය සහිතව 2022 නොවැම්බර් මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව 2022 නොවැම්බර් මස මහා සභා වාර්තාව පෙන්වා දෙන ලද සංශෝධනය සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන**

02 - 01 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව මඟින් පාලනය වන පෙරමඟ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉගෙනුම ලබන සිසුන් වෙනුවෙන් නිල ඇඳුම් කට්ටල 02 බැගින් ලබා දීම සඳහා සිසුන් 50 දෙනෙකු වෙනුවෙන් එක් නිල ඇඳුමක් රු. 1,025.00 බැගින් නිල ඇඳුම් කට්ටල 02 බැගින් ලබා දීම සඳහා රු. 102,500.00 මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 02 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

2023 වර්ෂයට වරිපනම් බදු ප්‍රතිශතය තීරණය කිරීම - මහනුවර මහා නගර සභාව යන මැයෙන් වූ ලිපිය (ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යැවූ ලිපියේ පිටපතක්) සභාගත කරන ලදී.

02 - 03 අධ්‍යක්ෂ, මධ්‍යම පරිසර අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, පොල්ගොල්ල
මහවැලි ගඟෙන් වැලි කැණීම සඳහා පාරිසරික නිර්දේශය - පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාවලපිටිය බටහිර ග්‍රාම නිලධාරි වසම - මහවැලි ගඟ, බව්වාගම වැල්ල වැලි මංකඩ, ජී. පී. එච්. කරුණාදාස මයා, අංක 8/10, බව්වාගම, නාවලපිටිය (ප්‍රාදේශීය කළමනාකරු (මධ්‍යම), භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, ප්‍රාදේශීය කාර්යාලය වෙත යවන ලද ලිපියේ පිටපතක්) යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 04 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
පළාත් පාලන ආයතනනයන්හි පවතින ඉඩම් ගැටළු නිරාකරණය පිළිබඳ සාකච්ඡාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 05 අධ්‍යක්ෂ, මධ්‍යම පළාත, බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව
බහුකාර්ය සංවර්ධන සහයකයින් හට අමතර දීමනා ලබා දීම යන මැයෙන් වූ ලිපිය (පළාත් පාලන කොමසාරිස් වෙත යවන ලද ලිපියේ පිටපතක්) සභාගත කරන ලදී.

02 - 06 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
වර්ෂ 1942 ට පසුව කරන ලද සංශෝධන වලින් සංශෝධිත වර්ෂ 1942 අංක 45 දරණ කර්මාන්ත ශාලා ආඥා පනත යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 07 ජනාධිපති ලේකම්,ජනාධිපති කාර්යාලය
පළාත් පාලන ආයතනවලට ඉඩම් නිදහස් කර ගැනීමේදී මතුව ඇති ගැටළු යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 08 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2023 වර්ෂය වෙනුවෙන් සකසන ලද පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක සැලැස්ම සභාගත කරන ලදී.

02 - 09 විගණන අධිකාරි, ජාතික විගණන කාර්යාලය, බත්තරමුල්ල
මූල්‍ය විගණනය - 2022 පළමු අර්ධ වර්ෂය යන මැයෙන් වූ විගණන වාර්තාව සභාගත කරන ලදී.

02 - 10 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාතෘ හා ළමා පෝෂණය පිළිබඳ අවධානය යොමු කරමින් දේශිය අමුද්‍රව්‍ය භාවිතා කර පෝෂණීය ආහාර වේලක් සකස් කර ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් කීහිපයක් පසුගිය කාලය පුරා පැවැත්වූ අතර, ඒ මඟින් මුල් ළමාවිය මධ්‍යස්ථාන දරුවන් හා ගැබිණී මාතාවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදි. එසේම පාසල් ළමුන්ගේද පෝෂණීය තත්වය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් කිහිපයක්ම දියත් කරන ලදි. මෙයට සමගාමීව බල ප්‍රදේශයේ සහන අවැසි (තෝරාගත්) පූර්ව ප්‍රසව ගාබිණී මාතාවන් පිළිබඳ අවධානය යොමු කර ඔවුන් රෝහල් ගතවීමේදී අත්‍යාවශ්‍ය වන ද්‍රව්‍ය අඩංගු කට්ටලයක් බැගින් ලබා දීමට හා මවගේ මෙන්ම ළදරුවන්ගේ පෝෂණීය ආහාර පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2022.12.20 වන අඟහරුවාදා දින පෙ. ව. 10.00 ට කාර්යාලීය සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. ගරු මහජන නියෝජිත ඔබ සැමට මෙම අවස්ථාවට සහභාගිවන මෙන් කාරුණිකව ආරාධනා කර සිටිමි.

02 - 11 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ මහජන සෞඛ්‍ය ආරක්ෂාව සුරක්ෂිත කිරීම පිණිස පෞද්ගලික භාවිතය හා පොදු භාවිතය තුළ පානීය ජල සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම පිණිස ඊට අදාල ජල මූලාශ්‍ර විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘතිවලට අදාල ජල මූලාශ්‍ර සංරක්ෂණයට අදාල ක්‍රියාමාර්ග ගැනීම ඇතුළු පානීය ජල සුරක්ෂිතතාවය වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනිම හා ඊට අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වන අතුරු ව්‍යවස්ථාව සභාගත කරන ලදි.

**03. මහජන පෙත්සම්,පැමිණිලි හා ලිපි සභාගත කිරිම**
නැත

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**
නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**
05 - 01 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජික ලැයිස්තුව සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 02 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සම්බන්ධව සකස් කරන ලද පුහුණු සැලැස්ම සඳහා සභා අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මහින්ද ගුණසේකර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 03 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 පළමු කාර්තුව හා දෙවන කාර්තුව සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා සභා අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 04 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාලයේ 2023 වර්ෂය සඳහා සකසන ලද ක්‍රියාත්මක සැලැස්ම සඳහා සභා අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 05 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
කඩියන්ලෙන උදාන ප්‍රජා සංවර්ධන සමිතියෙන් ලැබෙන රු. 50,000.00 ක මුදල කඩියන්ලෙන කැටඹුලා හි ලක්ෂ්මි පෙර පාසලේ වැසිකිළිය අළුත්වැඩියාව සඳහා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී වී. මුරලිදරන් මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 06 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2022 වර්ෂය සඳහා ප්‍රජා මණ්ඩල ප්‍රතිපාදන වෙනුවෙන් රු. 500,000.00 ක මුදලක් වෙන් වී ඇති අතර, මෙය දැනට පවතින ප්‍රජා මණ්ඩල 9 සඳහා වෙන් කිරීමේදී නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා සක්‍රීයව දායකත්වය දක්වමින් කමිටු වාරයන් සඳහා දිනපතා පැමිණීම අගය කරමින් පල්ලේගම ප්‍රජා මණ්ඩලයට හා මැදගහවතුර ප්‍රජා මණ්ඩලයට රු. 75,000.00 ක් ලෙසත් අනෙකුත් ප්‍රජා මණ්ඩල සඳහා රු. 50,000.00 බැගිනුත් ලබා දීම සුදුසු බවට කමිටු නිර්දේශය අනුව සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහාඅනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 – 07 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බව්වාගම ග්‍රාම නිලධාරි වසමේ පහත නම් සඳහන් පාරභෝගිකයන් ජල සම්පාදන මණ්ඩලයෙන් ජලය ලබා ගෙන ඇතත් අපගේ ලේඛනවලින් ඉවත් නොවීම හේතුවෙන් දිගින් දිගමට බිල් වී ඇත. එම මුදල ලේඛනවලින් ඉවත් කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

| කපා හැරීමට අදාල ජල පාරිභෝගිකයින්ගේ ලැයිස්තුව | | | | |
|---|---|---|---|---|
| | | | | 2019-07-31 දක්වා |
| අනු අංකය | පාරිභෝගික අංකය | නම | ලිපිනය | හිඟ මුදල (රු.) |
| 1 | 1083/BWW/41 | එම්.සී.මසානම් | නො.135/25,දෙකිඳ පාර,නාවලපිටිය | 4,650.00 |
| 2 | 1083/BWW/176 | ඩබ්.ජී.ගුණදාස | කුලේන්ද්‍රා වත්ත, බව්වාගම,නාවලපිටිය | 6,600.00 |
| 3 | 1083/BWW/177 | මර්සුක් හමීඩ් | කුලේන්ද්‍රා වත්ත, බව්වාගම,නාවලපිටිය | 6,300.00 |
| 4 | 1083/BWW/180 | එම්.ඒ.එම්.නසර්දීන් | කුලේන්ද්‍රා වත්ත, බව්වාගම,නාවලපිටිය | 7,445.00 |
| 5 | 1083/BWW/182 | ඒ.එච්.සිත්ති හම්සියා | කුලේන්ද්‍රා වත්ත, බව්වාගම,නාවලපිටිය | 7,525.00 |
| 6 | 1083/BWW/183 | ආර්.ඒ.ගුණසේන | කුලේන්ද්‍රා වත්ත, බව්වාගම,නාවලපිටිය | 7,000.00 |
| 7 | 1083/BWW/184 | එම්.ඒ.එච්.මොහොමඩ් | කුලේන්ද්‍රා වත්ත, බව්වාගම,නාවලපිටිය | 6,450.00 |
| 8 | 1083/BWW/185 | පී.විජේබණ්ඩාර | කුලේන්ද්‍රා වත්ත, බව්වාගම,නාවලපිටිය | 6,930.00 |
| 9 | 1083/BWW/189 | ආර්.ඒ.චාමිකා දිල්රුක්ෂි | බව්වාගම,නාවලපිටිය | 8,100.00 |
| 10 | 1083/BWW/223 | ටී.එච්.මුනිදාස | නො.06,බෙනඩික් මාවත, බව්වාගම | 6,915.00 |
| 11 | 1083/BWW/399 | වනජීවී නිළධාරි | වනජීවී කාර්යාලය, ඉඹුල්පිටිය,බව්වාගම | 3,225.00 |
| 12 | 1083/BWW/401 | පී.රාමචන්ද්‍රන් | නො.17/15,බෙනඩික් මාවත,බව්වාගම | 3,500.00 |
| 13 | 1083/BWW/412 | වනජීවී නිළධාරි | වනජීවී කාර්යාලය නිල නිවස, ඉඹුල්පිටිය,බව්වාගම | 4,725.00 |
| 14 | 1083/BWW/640 | ඉංජිනේරු කාර්යාලය | නො.54,ගම්පල වත්ත,ගම්පල | 8,500.00 |
| එකතුව | | | | 87,865.00 |

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 –08 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පීපී ඒ 3130 කැබලි අංක 59 දරණ ඉඩම් කොටස සුසාන භූමියක් සඳහා අවශ්‍ය නොවන බවට එකඟතාවයක් ලිඛිතව ලබා ගැනීමට අවශ්‍ය බව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් විසින් එවා ඇති ලිපියට අනුව එම ඉඩම් කොටස දෙල්ගහඇල්ල පොදු සුසාන භූමිය පවතින බැවින් අදාල ඉඩම් කොටස සුසාන භූමියක් සඳහා අවශ්‍ය නොවන බවට එකඟතාවය දන්වා යැවීමට සහා අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 09 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
දෛනික වැටුප් ගෙවීමේ පදනම මත සේවයේ යොදවා ගන්නා ලද පහත නම් සඳහන් සේවකයන් දෙදෙනා වෙනුවෙන් 2023 ජනවාරි මස සිට ඉදිරි මාස 06 කට සේවා කාලය දීර්ඝ කිරීම හා වැටුප් ගෙවීමට පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. එම්. කැලුම් මල්සිරි පෙරේරා
2. ඊ. ජී. අකිල චන්දිමාල් ඊරියගම

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 –10 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පස්බාගේ කෝරළේ ප්‍රා දේශීය සභාවේ 2021 වර්ෂයේ ගරු ප්‍රා දේශීය සභා මන්ත්‍රී එම්. එල්. සී. ආර්. මොල්ලිගොඩ මැතිතුමාගේ ප්‍රතිපාදන වලින් රු. 40,000.00 ක මුදලක් වෙන් කර ග්ලෙන්ෆන් වතු නිවාස සඳහා 50mm (PNT 11) පීවීසී බට ලබා දීම සඳහා සහා අරමුදලින් වියදම් දැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති අතර මිලදී ගැනීම් සඳහාඇන්ටන් ජලනල

උපාංග ආයතනය මගින් 50mm (PNT 11) පීවීසී බටයක් සඳහා අනුමත මුදල රු. 1,772.40 ක් වුවත් (2021.10.25 මහා සභාවේ ටෙන්ඩර් මණ්ඩල අංක 08-06) මිල උච්චාවදනයත් සමඟ අදාල ජලනල උපාංග ලබා දී ඇති මිල ගණන්වලට ලබා දීමට නොහැකි බව දන්වන ලදි. නමුත් දෙවනුව අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති කේ. එස්. ඩී. සිල්වා ආයතනයෙන් අදාල භාණ්ඩ ඉදිරිපත් කර ඇති මිල ගණන වන රු. 3,180.00 ට ලබා දිය හැකි බව දන්වන ලදි. ඒ අනුව අවශ්‍ය පීවීසී බට කේ. එස්. ඩී. සිල්වා ආයතනයෙන් මිලදී ගැනීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී කේ.ඕ සෝමතිලක මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 – 11 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2023 වර්ෂය සඳහා පහත සඳහන් ලෙස මුදල් කමිටු සාමාජිකයින් අනුමත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

කමිටු සභාපති - ගරු සභාපතිතුමා, ඕ. ජී. රෝහණ බණ්ඩාර මයා

අනෙකුත් ගරු මන්ත්‍රීවරු
එස්. ඒ. ටී. පුෂ්පකුමාර මයා
ජී. කේ. ජී. ෆොන්සේකා මිය

අනෙකුත් නිලධාරීන් -
1. ප්‍රියංකා චාන්දනී මිය - ලේකම්තුමිය
2. පද්මිණී සමරකෝන් මිය - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
3. ප්‍රදීප් කුමාර මයා - සංවර්ධන නිලධාරී
4. උමයංග හේරත් මයා - සංවර්ධන නිලධාරී (මුදල් කමිටු ලේකම්)
5. නිලංකා මධුවන්ති මිය - කළමනාකරණ සේවා නිලධාරී
6. බුද්ධිකා ලියන්දෙණිය මිය - සංවර්ධන නිලධාරී
7. අමල්කා විතාන මිය - සංවර්ධන නිලධාරී
8. ඊ. ජී. ශ්‍රියාලතා මිය - කළමනාකරණ සේවා නිලධාරී
9. සුරංජි මධුෂානි පල්ලේගෙදර මිය - සංවර්ධන නිලධාරී
10. ප්‍රීතිකා රුක්ෂානි මිය - සංවර්ධන නිලධාරී
11. යමුනා ප්‍රියදර්ශනී මිය - සංවර්ධන නිලධාරී

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>
එකම පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් තිදෙනෙක් සහභාගි වන නිසා මුදල් කමිටුව සඳහා ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය සුදුසු බව මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය</u>
මුදල් කමිටුව සඳහා ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය සුදුසු බව මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
ඉහත යෝජනා මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 12 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2023 වර්ෂය සඳහා පහත සඳහන් ලෙස නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු සාමාජිකයින් අනුමත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

කමිටු සභාපති - ගරු උප සභාපතිතුමා, එච්. ඒ. නන්දසෝම මයා

අනෙකුත් ගරු මන්ත්‍රීවරු
ජී. කේ. ජී. ෆොන්සේකා මිය
කේ. ඕ. සෝමතිලක මයා

අනෙකුත් නිලධාරීන් -
1. ලාල් හේරත් මයා - ප්‍රජා සංවර්ධන නිලධාරී
2. එන්. පී. වෙදගෙදර මිය - පුස්තකාලයාධිපතිනිය
3. සුමනානන්ද මයා - තාක්ෂණ නිලධාරී
4. බුද්ධිකා ලියන්දෙණිය මිය - සංවර්ධන නිලධාරී
5. ප්‍රසාදිනී මැණිකේ මිය - සංවර්ධන නිලධාරී
6. ඊ. ජී. එස්. පී. කරුණාරත්න මිය - සංවර්ධන නිලධාරී (කමිටු ලේකම්)

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 – 13 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2023 වර්ෂය සඳහා පහත සඳහන් ලෙස ගැටුම් සමථකරණ කමිටු සාමාජිකයින් අනුමත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.
කමිටු සභාපති - ගරු උප සභාපතිතුමා, එච්. ඒ. නන්දසෝම මයා
අනෙකුත් ගරු මන්ත්‍රීවරු එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
අයි. රාමකිලි මයා
ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
අනෙකුත් නිලධාරීන් -
1. සුමනානන්ද මයා - තාක්ෂණ නිලධාරි
2. දිල්රුක් දිසානායක මයා - පරිසර නිලධාරි
3. පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක
4. පල්ලියගුරුගේ මයා - ආදායම් පරීක්ෂක
5. එම්. පී. එම්. සී. ප්‍රදීප් කුමාර මයා - සංවර්ධන නිලධාරි (කමිටු ලේකම්)

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 14 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2023 වර්ෂය සඳහා පහත සඳහන් ලෙස කාර්මික සේවා කමිටු සාමාජිකයින් අනුමත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.
කමිටු සභාපති - ගරු මන්ත්‍රී වී. මුරලිදරන් මයා
අනෙකුත් ගරු මන්ත්‍රීවරු එච්. ජී. මෛත්‍රීපාල මහතා
ඒ. ජී. ටී. ඒ. සිරිසේන මයා
අනෙකුත් නිලධාරීන් -
1. එම්. එම්. සී.එම්. අබේසිංහ මිය - සංවර්ධන නිලධාරි (කමිටු ලේකම්)
2. සුමනානන්ද මයා - තාක්ෂණ නිලධාරි
3. බී. ඇනා මේරි මිය - වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා
4. ප්‍රසාදිනී මැණිකේ මිය - සංවර්ධන නිලධාරි
5. ඩී. එන්. ටී. හෙට්ටිගේ මිය - සංවර්ධන නිලධාරි

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 15 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2023 වර්ෂය සඳහා පහත සඳහන් ලෙස පරිසර හා පහසුකම් කාරක සභාව සඳහා සාමාජිකයින් අනුමත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.
කමිටු සභාපති - ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මයා
අනෙකුත් ගරු මන්ත්‍රීවරු එච්. ජී. මෛත්‍රීපාල මහතා
ශාන්තලාල් පෙරේරා මයා
ජී. කේ. ජී. ෆොන්සේකා මිය
අනෙකුත් නිලධාරීන් -
1. පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය
2. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි/ මහජන සෞඛ්‍ය පරීක්ෂක, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, නාවලපිටිය
3. පොලිස් ස්ථානාධිපතිතුමා මහින්, ස්ථානාධිපති, පරිසර පොලිස් ඒකකය, පොලිස් ස්ථානය, නාවලපිටිය
4. අඩවිවන නිලධාරි, අඩවිවන නිලධාරි කාර්යාලය, බව්වාගම, නාවලපිටිය
5. අධ්‍යක්ෂ (මධ්‍යම පළාත), මධ්‍යම පරිසර අධිකාරි ප්‍රාදේශීය කාර්යාලය,පොල්ගොල්ල වේල්ල අසල, පොල්ගොල්ල
6. කෘෂිකර්ම උපදේශක, ගොවිජන කේන්ද්‍රය, රඹුක්පිටිය
7. පොලිස් අධිකාරිතුමා මහින්, ප්‍රජා සම්බන්ධීකරණ නිලධාරි, පොලිස් අධිකාරි කාර්යාලය, මහර, ගම්පොල
8. අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, පරිසර හා වන සම්පත් අංශය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරි කාර්යාලය, රිවර්සයිඩ්, මාවතුර
9. ඩී. ඒ. සුදුබණ්ඩාර මයා, කටුකිතුල, ගෝනාවලපතන, නාවලපිටිය
10. සංජය සිරිවර්ධන මයා, පරිසර හා කෘෂිවේදී ගවේෂන සංගමය, අංක 4/44, ගම්පොල පාර, නාවලපිටිය
11. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව, සභා ලේකම්

12. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව, ආදායම් පරීක්ෂක
13. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව, කළමනාකරණ සේවා නිලධාරි (බලපත්‍ර)
14. තාක්ෂණ නිලධාරි
15. සංවර්ධන නිලධාරීන්

ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
පරිසර හා පහසුකම් කාරක සභාව සඳහා ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා සුදුසු බව මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 16 ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
2022 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 80,000.00 ක මුදල ඉතිරිව ඇති අතර, එම මුදල පත්තුනුපිටිය පස්බාගේවත්ත මාර්ගයේ ඉහළ කොටස සංවර්ධනය සඳහා යෙදවීමට සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව මම යෝජනා කරමි.

ගරු එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 17 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
කඩියන්ලෙන ජනපදයේ වතුයායේ වර්ෂා ජලය බැසයාම ඇල මාර්ගයට හරවා දීම සඳහා තාක්ෂණ නිලධාරි විසින් සකසන ලද රු. 35,851.20 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බව මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී වී. මුරලිදරන් මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 18 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 18(2) වගන්තිය යටතේ විගණන ගාස්තු - 2021 ලිපියට අනුව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම වෙනුවෙන් ජාතික විගණන කාර්යාලය වෙත ගෙවිය යුතු විගණන ගාස්තුව වන රු. 201,000.00 ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 19 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
රඹුක්පිටිය මහජන පුස්තකාලය සහ එයට අනුබද්ධව ඇති ජංගම පුස්තකාල සඳහා දැනිවීම් පුවරු සාදා ගැනීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 20 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
නාවලපිටිය පරිවාස කාර්යාලය මඟින් අධීක්ෂණය කරනු ලබන හවුස් ඔෆ් හෝප් ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ දරුවන් 15 දෙනෙකු නේවාසික රැකවරණයේ පසු වෙයි. මේ වන විට එම මධ්‍යස්ථානයේ කුඩා පුස්තකාලයක් පවත්වාගෙන යනු ලබයි. මෙම දරුවන්ට අවශ්‍ය විෂය සමගාමී මෙන්ම විෂය බාහිර සාමාන්‍ය දැනුම ලබා ගැනීම සඳහා පොත්වල අවශ්‍යතාවයක් ඇති බැවින් විධිමත් ක්‍රමවේදයක් අනුව බැහැරට ලබා දෙනු ලබන පොත් ප්‍රමාණයක් තාවකාලිකව ලබා දෙන ලෙස නාවලපිටිය

ස්ථානාභාර පරිවාස නිලධාරිතුමා විසින් ඉල්ලීම් කර ඇත. අදාල කාලසීමාව තුළ නියමිත පරිදි නැවත භාරදෙන බවද සඳහන් කර ඇති බැවින් එම පොත් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී කේ.ඕ සෝමතිලක මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 21 ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
2022 වර්ෂය සඳහා මා හට හිමි මුදල් වලින් රු. 75,000.00 ක් වීථි ලාම්පු දැමීම සඳහා යෝජනා ස්ථිර විය. රු. 100,000.00 ක් වරකාව සුසාන භූමිය සංවර්ධනය කිරීම සඳහා යෝජනා ස්ථිර විය. එම යෝජනා දෙක සංශෝධනය කර වරකාව ගම මැද මාර්ගය කොන්ක්‍රීට් කිරීම හෝ ප්‍රිමික්ස් අතුරා පැච් වැසීම සඳහා එම මුළු මුදල වන රු. 175,000.00 ක ප්‍රතිපාදන වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 22 ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
ශාන්ත ජනපද ප්‍රධාන මාර්ගයේ එම්. ඩී. කරුණාරත්න මයාගේ නිවස අසල කොටස කැඩී ඉතාම අබලන් තත්වයේ ඇත. එම ස්ථානය කොන්ක්‍රීට් කර පිලිසකර කර ගැනීම සඳහා සිමෙන්ති මිටි 10 ක් හා ¾" මැටල් කියුබ් 01 ක් ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 23 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
නඩු අංක 84758 නාවලපිටිය දිසා අධිකරණය වෙනුවෙන් 2022.11.08 වන දින පෙනී සිටීමේ ගාස්තු සහ ලිඛිත දේශනය සූදානම් කිරීම වෙනුවෙන් රු. 15,000.00 ක මුදලක් නීතිඥ නයනානන්ද අලුත්ගමගේ මහතා වෙත ගෙවීම සුදුසු බව මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 24 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාබල ප්‍රදේශයේ අධික වර්ෂාව හේතුවෙන් ආපදාවට ලක් වූ පාලම් ප්‍රතිසංස්කරණය සඳහා තාක්ෂණික ඇඟයීම් කමිටුවට සහභාගි වූ නිලධාරීන් සඳහා දීමනා වශයෙන් රු. 42,000.00 ක මුදලක් ගෙවීමට හා මාණ්ඩලික නිලධාරීන්ට, ලිපිකරු නිලධාරීන්ට හා සෙසු නිලධාරීන්ට තාක්ෂණික ඇඟයුම් කමිටුවට සහභාගි වීම වෙනුවෙන් දීමනා වශයෙන් රු. 11,000.00 ක මුදලක් ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 25 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පාසල් ළමුන් සඳහා පොත් ලබා දීම වෙනුවෙන් රු. 500,000.00 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 26 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
"සඳකැළුම්" මීපිටිය, නාවලපිටිය යන ලිපිනයේ පදිංචි කේ. එම්. එච්. එස්. බණ්ඩාර යන අය ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මහනුවර YMBA වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ 2022.07.04 සිට 2022.12.31 දක්වා ක්‍රියාත්මක වන පූර්ණ කාලීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී පාඨමාලාව (NVQ Level 04 - මාස 06) හදාරන අතර එම මාස 06 අවසානයේ අවසාන ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට ආයතනික ප්‍රායෝගික පුහුණුවක් ලැබිය යුතුව ඇත. ඒ සඳහා අප සභාවේ අවස්ථාවක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 27 ගරු මන්ත්‍රී එස්. ඒ. ටී. පුෂ්පකුමාර මහතා
2022 වර්ෂය සඳහා මා හට හිමි මුදල් වලින් රු. 100,000.00 ක් වැවේගම සුසාන භූමිය බැකෝ යන්ත්‍රයක් දමා මට්ටම් කිරීමට හා ජල නල ලබා ගැනීම සඳහා යෝජනා ස්ථිර විය. එම යෝජනාව සංශෝධනය කර වැවේගම ඉහළ මාර්ගයේ කැඩී ඇති කොන්ක්‍රීට් කොටස් සංවර්ධනය සඳහා එම මුදල වන රු. 100,000.00 ක ප්‍රතිපාදන වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 28 ගරු මන්ත්‍රී එස්. ඒ. ටී. පුෂ්පකුමාර මහතා
2022 වර්ෂය සඳහා මා හට හිමි මුදල් වලින් රු. 100,000.00 ක් දෙකිඳ පරනවත්ත පාර සංවර්ධනය සඳහා යෝජනා ස්ථිර විය. එම යෝජනාව සංශෝධනය කර වැවේගම ගල්පොත්ත පීල්ල සංවර්ධනය සඳහා එම මුදල වන රු. 100,000.00 ක ප්‍රතිපාදන වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 29 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
දෙකිඳ අලුත්ගම සියපත් පවුර ළමා සමාජය සඳහා රු. 25,000.00 ක මුදලකින් වොලිබෝල් උපකරණ හා දැල්පන්දු උපකරණ ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා සභා ගර්භයෙන් පිටව යන ලදි.

05 - 30 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
අද දින ලේකම්තුමිය අග්‍රාමාත්‍ය කාර්යාලයේ පැවැත්වෙන ඵලදායිතා සම්මාන උළෙල සඳහා සහභාගී වී ඇති බැවින් අද දින සභාවේ වැඩ බලන ලේකම් ලෙස පද්මිණී සමරකෝන් මිය පත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 31 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2023 වර්ෂය වෙනුවෙන් සකසන ලද අයවැය ලේඛනය අනුමත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා ගරු සභාපතිතුමාගේ අයවැය පණිවිඩය හා පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය වෙනුවෙන් සම්පාදිත අයවැය පිළිබඳව ලේකම්ගේ පණිවිඩය හා වාර්තාව අද දින සභාවේ වැඩබලන ලේකම් ලෙස කටයුතු කරන පද්මිණී සමරකෝන් මිය විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී. ඒ අනුව 2023 වර්ෂය වෙනුවෙන් සකසන ලද අයවැය ලේඛනය ඒකච්ඡන්දයෙන් සභා සම්මත විය.

<u>06. **කාරක සභා වාර්තා සභා සම්මත කිරීම**</u>

| | | |
|---|---|---|
| 06 - 01 මුදල් කාරක සභාව | - | 2022.12.06 |
| 06 - 02 නිවාස ප්‍රජා සංවර්ධන කාරක සභාව | - | 2022.12.05 |
| 06 - 03 කාර්මික සේවා කාරක සභාව | - | 2022.12.05 |
| 06 - 04 පරිසර හා පොදු පහසුකම් කාරක සභාව | - | 2022.12.08 |
| 06 - 05 ගැටුම් සමථකරණ කාරක සභාව | - | 2022.12.05 |
| 06 – 06 පුස්තකාල උපදේශක කමිටු රැස්වීම | - | 2022.12.14 |

<u>07. **බැංකු සැසඳුම් ප්‍රකාශය, අභ්‍යන්තර විගණන වාර්තාව, ලැබීම් සාරාංශය, ගෙවීම් සාරාංශය, ගෙවීම් වාර්තාව, පුස්තකාල ප්‍රගතිය, සංවර්ධන ප්‍රගතිය ඉදිරිපත් කිරීම**</u>

- 2022.11.01 දින සිට 2022.11.30 දක්වා වවුචර් අංක 1335 සිට 1535 i දක්වා ගෙවීම් වවුචර් සභාගත කරන ලදී.
- බැංකු සැසඳුම් ප්‍රකාශය

## බැංකු සැසඳුම් ප්‍රකාශනය - 2022 නොවැම්බර්

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

ගිණුම් අංකය :- 053-1-001-6-4889286
මාසය :-2022 නොවැම්බර්

| | | | | |
|---|---|---|---|---|
| 2022.11.01 දිනට මුදල් පොතේ ශේෂය | රු. | 8,324,615.77 | | |
| එකතු කළා : නොවැම්බර් මස මුළු ලැබීම් | රු. | 8,853,882.87 | | |
| අඩු කළා :- නොවැම්බර් මස මුළු ගෙවීම් | රු. | 7,807,041.82 | | |
| 2022.11.30 දිනට මුදල් පොතේ ශේෂය | | | රු. | 9,371,456.82 |
| <u>එකතු කළා</u> | | | | |
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් (උ:ලේ 01) | රු. | 519,843.48 | | 519,843.48 |
| | | | | 9,891,300.30 |
| <u>අඩු කළා</u> | | | | |
| අත ඉතිරි මුදල් හා චෙක්පත් (උ:ලේ 02) | රු. | 13,719.02 | | |
| බැංකු ගාස්තු (උ:ලේ 03) | රු. | 3,892.30 | | |
| | | | රු. | 17,611.32 |
| 2022.11.30 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය | | | | 9,873,688.98 |

- 2022 නොවැම්බර් මස ගෙවීම් සාරාංශය

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**

**මාසික ඒකාබද්ධ වැය සාරාංශය - 2022 නොවැම්බර් මාසය**

| අය විෂය නාමයන් | එකතුව | මුළුඑකතුව |
|---|---|---|
| 01. වැටුප් හා දීමනා | 3,301,133.57 | |
| 02. ගමන් වියදම් | 41,624.00 | |
| 03. සැලසුම් හා උපකරණ | 664,132.29 | |
| 04. ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | 682,965.39 | |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 253,373.53 | |
| 06.පොලී ගෙවීම් ලාභාංශය හා ප්‍රසාද මුදල් | 82,406.76 | |
| 07. ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 9,260.00 | |
| 08. විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතොෂිත | 4,975.15 | |
| **පුනරාවර්ථන වියදම් එකතුව** | | **5,039,870.69** |
| ප්‍රාග්ධන වියදම් | | |
| 09.ප්‍රාග්ධන වැය | 1,297,081.02 | |
| 10. ණය ආපසු ගෙවීම් | 199,076.22 | |
| **ප්‍රාග්ධන වැය එකතුව** | | 1,496,157.24 |
| **පුනරාවර්ථන වැය හාප්‍රාග්ධන වැය මුළු එකතුව** | | **6,536,027.93** |
| විවිධ ණය හිමියන් | - | |
| කර්.ණයහිමියන් (309-3-I) | | |
| කර්.ණයහිමියන් (309-3-III) | | |
| කර්.ණයහිමියන් (304-5) | | |
| 10% කර්මාන්ත තැන්පත් | | |
| විවිධ තැන්පත් | 889,074.51 | |
| මුද්දර තැන්පත් | | |
| දේපල ණය පොළී | 10,867.22 | |
| සේවක ණය | 291,678.00 | |
| අත්තිකාරම් | 709,280.00 | |
| සමුච්චිත අරමුදල | | |
| ලිපිද්‍රව්‍ය ගබඩා අත්තිකාරම් | 115,457.10 | |
| ජල ගබඩා අත්තිකාරම් | 703,544.00 | |
| අහරු චෙක්පත් | | |
| කර්.ණයගැතියන් | | |
| **එකතුව** | | **2,719,900.83** |
| **2022/11/31 දක්වා මුළු ගෙවීම් වල එකතුව** | | **9,255,928.76** |

- 2022 නොවැම්බර් මස ලැබීම් සාරාංශය

පස්බාගේකෝරළේ ප්‍රාදේශීය සභාව

**2022 නොවැම්බර් මාසය සඳහා ඒකාබද්ධ ලැබීම් සාරාංශය**

| අය විෂයන් | මුළු එකතුව | |
|---|---|---|
| | රු.ශත | |
| 10 වරිපනම් හා බදු | 374,226.43 | |
| 20 කුලී | 303,980.80 | |
| 30 බලපත්‍ර ගාස්තු | 34,250.00 | |
| 40 සේවා සඳහා ගාස්තු | 911,536.90 | |
| 50 වරෙන්තු ගාස්තු | 60,750.96 | |
| 60 වෙනත් ආදායම් | 4,198,430.19 | |

| | | |
|---|---|---|
| 70 වෙනත් ආධාර | 3,063,915.71 | |
| පුනරාවර්ථන ආදායම් එකතුව | | **8,947,090.99** |
| ප්‍රාග්ධන ආදායම | - | |
| 80 මූලධන ලැබීම් | 432,951.62 | |
| එකතුව | | 432,951.62 |
| පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් වල මුළු එකතුව | | **9,380,042.61** |
| **වෙනත් ලැබීම්** | | |
| ජල ණය ගැතියෝ | 5,498.00 | |
| ජල තැන්පත් | 1,000.00 | |
| මුද්දර | 3,225.00 | |
| විවිධ තැන්පත් | 167,741.68 | |
| සේවක ණය | 195,643.01 | |
| කර්මාන්ත තැන්පත් | | |
| දේපල ණය | 10,867.22 | |
| විවිධ ණය ගැතියෝ | | |
| අත්තිකාරම් පියවීම | 388,550.00 | |
| ජල ගබඩා අත්තිකාරම් පියවීම | 148,677.29 | |
| රු 25 මුද්දර | 1,525.00 | |
| කර්මාන්ත ණය ගැතියෝ | | |
| වෙනත් ලැබීම් | | |
| වෙනත් ලැබීම් වල එකතුව | | **922,727.20** |
| 2022/11/31 දක්වා මුළු ලැබීම් එකතුව | | **10,302,769.81** |

- 2022 නොවැම්බර් මස පුස්තකාල ප්‍රගතිය

01. නව සාමාජික සංඛ්‍යාව - 04
02. සාමාජිකත්වය අලුත් කළ සංඛ්‍යාව - 06
03. පොත් බැහැර දීම - 1,112
04. ව්‍යාප්ත සේවා -
05. රැස්කළ ආදායම(පුස්තකාල) - 1,680.00
(නැණසල) - 1,500.00

**08.<u>ටෙන්ඩර් මණ්ඩලය</u>**

08 – 01 ජංගම සායන සඳහා ඖෂධ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| අනු අංකය | විස්තරය | හේවාමාන්න ආයතනය, නාවලපිටිය | ජී. කො. ජී. අරියදාස සහ පුත්‍රයෝ |
|---|---|---|---|
| | | වටිනාකම | වටිනාකම |
| 01 | පිප්පලසාසවය | මෙහි ඖෂධ කීපයක අඩුවක් ඇති හෙයින් මෙම ලැයිස්තුව සැපයීමට හැකියාවක් නොමැති බව දන්වා ඇත. | 1,410.00 |
| 02 | පුනර්නවාසවය | | 1,040.00 |
| 03 | මධුකා පැණිය | | 1,140.00 |
| 04 | නවරත්න කල්කය | | 1,615.00 |
| 05 | ශර්කරාදි කල්කය | | 1,710.00 |
| 06 | දෙසදුන් කල්කය | | 910.00 |
| 07 | අවිපත්තිකර චූර්ණය | | 1,125.00 |

| | | |
|---|---|---|
| 08 | තාලිසාදි / සීනෝපලදි චූර්ණය | 1,600.00 |
| 09 | යෝගරාජ ගුග්ගුල් | 1,080.00 |
| 10 | නිර්ගුණ්ඩසාදී තෛලය | 6,940.00 |
| 11 | පින්ඩ තෛලය | 3,580.00 |
| 12 | විසර්පහර තෛලය | 3,135.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා ආයතන 03 කින් මිල ගණන් කැදවීම් කළද ලැබී ඇත්තේ ඉහත ආයතනයෙන් පමණකි. මෙම කාර්යය කඩිනමින් කළ යුතු කාර්යයක් බැවින් එම මිල ගණන් සපයා ඇති ජී. කේ. ජී. ආරියදාස සහ පුත්‍රයෝ නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 02 පොලිතින් සීලරයක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැදවීම.

| අනු අංකය | විස්තරය | මහනුවර ඒජන්සීස්, නො.7, කුමාර වීදිය මහනුවර | | | දිනපාල පුද්ගලික සමාගම, නාවලපිටිය | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ගය | ඒකක මිළ | වගකීම් කාලය | වර්ගය | ඒකක මිළ | වගකීම් කාලය |
| 01 | 18" පැඩල් සීලර් | Thaiwan | 165,000.00 | 6 Month | Mercier | 160,090.00 | 6 Month |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා අවම මිල ගණන් සපයා ඇති දිනපාල පුද්ගලික සමාගම, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 03 ශබ්ද විකාශන යන්ත්‍ර මිලදී ගැනීමට මිල ගණන් කැදවීම.

| අනු අංකය | විස්තරය | දිනපාල පුද්ගලික සමාගම, නාවලපිටිය | |
|---|---|---|---|
| | | වර්ගය | ඒකක මිළ |
| 01 | Armp | 80w Ahuja | 85,450.00 |
| 02 | Unit with Hone | 60w Ahuja | 34,240.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා ආයතන 03 කින් මිල ගණන් කැදවා තිබුණද මිල ගණන් එවා ඇත්තේ එක් ආයතනයකින් පමණි. මෙම කාර්යය කඩිනමින් කළ යුතු කාර්යයක් බැවින් එම මිල ගණන් සපයා ඇති දිනපාල පුද්ගලික සමාගම, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 04 2' x 8'බෝක්කු බට මිලදී ගැනීමට මිල ගණන් කැදවීම.

| අනු අංකය | විස්තරය | ෂියාබා කොත්මලේ හියුම් පයිප් ඉන්ඩස්ට්‍රීස්, නො. 8, කර්මාන්ත පුරය, නාවලපිටිය පාර, උලපනේ | |
|---|---|---|---|
| | | | ඒකක මිළ |
| 01 | 2' x 8'බෝක්කු බට | ප්‍රවාහනය සමඟ | 27,500.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා ආයතන 03 කින් මිල ගණන් කැදවා තිබුණද මිල ගණන් එවා ඇත්තේ එක් ආයතනයකින් පමණි. මෙම කාර්යය කඩිනමින් කළ යුතු කාර්යයක් බැවින් එම මිල ගණන් සපයා ඇති ෂියාබා කොත්මලේ හියුම් පයිප් ඉන්ඩස්ට්‍රීස්, නො. 8, කර්මාන්ත පුරය, නාවලපිටිය පාර, උලපනේ යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 05 252-6380 දරන වාහනයේ දුනු අළුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් කැදවීම.

| අංකය | විස්තරය | උදාරා මෝටර්ස් | ඉඹුල්පිටිය මෝටර්ස් | ශාන්ත ජෝශප් වර්ක් ෂොප් |
|---|---|---|---|---|
| | අමතර කොටස් හා මිල ගණන් | | | |
| 1 | පිටුපස දකුණු දුනු මිටියේ පළමු කොළය | 7,300.00 | 23,500.00 | 52,000.00 |
| 2 | පිටුපස දකුණු දුනු මිටියේ දෙවන කොළය | 6,100.00 | | |
| 3 | පිටුපස දකුණු හා වම්පස තුන්වන කොළ 2 | 10,700.00 | 9,000.00 | |
| 4 | පිටුපස දකුණු හා වම්පස හතරවන කොළ 3 | 9,500.00 | | |
| 5 | දෙපසම සෙන්ටර් බෝල්ට් 02 | 800.00 | 1,000.00 | 1,200.00 |
| 6 | දෙපසම රබර් බුෂ් 08 | 2,800.00 | 3,200.00 | 3,500.00 |
| 7 | දෙපසම සයිලන්ට් බුෂ් 02 | 2,900.00 | 3,000.00 | |
| | එකතුව | 40,100.00 | 39,700.00 | 56,700.00 |
| | | | | |
| | වැඩ කුලිය | | | |
| 1 | පිටුපස දෙපසම දුනු හැඩ ගැසීම, බ්‍රකට් පැස්සීම, රබර් බුෂ් හා සයිලනස් බුෂ් ගසා දුනු මිට 2 සවි කිරීම | 18,000.00 | 22,000.00 | 7,000.00 |
| 2 | පිටුපස බපරය ඇද බිම ජැකි එකට දමා කෙලින් කර ඇද ඇර සවි කිරීම, ස්පෙයාර් වීල් බ්‍රකට් සවි කිරීම හා යකඩ දමා හැඩලය සෑදීම | | | |
| 3 | වාහනයේ බොඩි බැලන්ස් කිරීම සඳහා | | | |
| | එකතුව | 18,000.00 | 22,000.00 | 7,000.00 |
| | | | | |
| | මුළු එකතුව | 58,100.00 | 61,700.00 | 63,700.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති උදාරා මෝටර්ස්, නො. 100, තලවකැලේ පාර, ඉඹුල්පිටිය, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 06 ZA 5171 බැකෝ JCB යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් කැඳවීම.

| අනු අංකය | විස්තරය | සුසන්ත මෝටර්ස් | | එක්සත් මෝටර්ස් | | සම්පත් ඉලෙක්ට්‍රිකල්ස් | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය | වටිනාකම | ප්‍රමාණය | වටිනාකම | ප්‍රමාණය | වටිනාකම |
| 01 | හයිඩ්‍රොලික් හෝස් | 2.5m | 12,900.00 | 2.5m | 13,900.00 | 2.5m | 17,000.00 |
| 02 | SAE 30 ඔයිල් | 5L | 17,950.00 | 5L | 17,950.00 | 5L | 21,000.00 |
| 03 | ඩීසල් හෝස් | 1m | 1,750.00 | 1m | 1,800.00 | 1m | 2,000.00 |
| 04 | හෝස් ක්ලිප් | 2 | 450.00 | 2 | 500.00 | 2 | 500.00 |
| 05 | කිකර් පොම්ප් කිට් | 1 | 700.00 | 1 | 750.00 | 1 | 3,500.00 |
| 06 | ට්‍රාන්ස්පෝර්ට් | | 3,000.00 | | 3,500.00 | | 4,000.00 |
| 07 | වැඩ කුලිය | | 10,000.00 | | 12,000.00 | | 13,500.00 |
| | එකතුව | | 46,750.00 | | 50,400.00 | | 61,500.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති සුසන්ත මෝටර්ස්,නො. 53, ඉඹුල්පිටිය, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 07 2023 වර්ෂය සඳහා දින පොත් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම

| අනු | වර්ගය | Rajah Press | Midland | Solid Net |
|---|---|---|---|---|

| අංකය | | | Priners | |
|---|---|---|---|---|
| | | ඒකක මිළ | ඒකක මිළ | ඒකක මිළ |
| 01 | දින පොත් | 850.00 | 900.00 | 930.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති රාජා මුද්‍රණාලය, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>09. වෙනත් කරුණු</u>**

සාකච්ඡා කිරීමට වෙනත් කරුණු නොවූ බැවින් ගරු සභාපතිතුමා පැමිණ සිටි පිරිසට ස්තූතිය පළ කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 2.00 ට පමණ අවසන් කරන ලදී.

සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
දංගොල්ල පාරේ ප්‍රශ්නය විසඳන්න සභාවෙන් යන නිලධාරීන්ට රාජකාරි කරන්න දෙන්නැති ගැටළුවක් තියනවා. වාර 3 ක් එහෙම වුනා. නීතිමය පැත්තෙන් සහයෝගයක් ගන්න වෙයි.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පොලිස් ආරක්ෂාවත් සමඟ යන්න වෙන්නේ.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
සභාවේ සියළු කම්කරුවන් යොදවලා හරි පොලිස් ආරක්ෂාව යටතේ මේ මාසෙම දිනයක් දාගෙන හරි පාර විවෘත කරන්න කටයුතු කරමු.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
නාගස්තැන්න පාරේ තැන් කීපයක පස් ඉවත් කරන්න බැකෝ යන්ත්‍රය අවශ්‍යය වෙනවා.

<u>ගරු මන්ත්‍රී එන්.එම් සුසිලා දමයන්ති මිය</u>
කහමානගම ජල බිල් කැඩීමට කෙනෙක් යන් නැති ගැටළුවක් තියනවා. චන්ද්‍රා මිය පෙරදී ගිහින් තියනවා. දැනට බිල් එකතු වෙයි කියලා පාරිභෝගිකයන්ට ගැටළුවක් තියනවා.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
පිල්ටර් ටැංකිය ගැන කාර්මික සේවා කාරක සභාවෙදි කථා වුනා.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පිල්ටර් ටැංකියක් හදන්න තාක්ෂණ නිලධාරි කෙනෙක්ගේ වාර්තාවක් ඉක්මනටම සතියක් ඇතුලත වගේ ගැනීමට කටයුතු කරන්න.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
තාක්ෂණ නිලධාරි තනතුරේ ගැටළුව බලපානවා. දැනට සති 2 කට හරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තාක්ෂණ නිලධාරි කෙනෙකුගේ සහාය ලබා ගමු.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
අභ්‍යන්තර විගණන වාර්තාව අනුව කම්කරුවන් නිසි පරිදි රාජකාරි කරනවද කියලා අධීක්ෂණයක් කරන්න වෙයි. 2022.11.01 සිට 2022.11.30 දක්වා ඩීසල් ලීටර 2500 ක් ගහලා තියනවා. මෙ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

<u>ගරු මන්ත්‍රී එන්.එම් සුසිලා දමයන්ති මිය</u>
පත්තුනුපිටිය ඉස්කෝලේ ග්‍රවුන්ඩ් එක සුද්ධ කරගන්න අවශ්‍යායි.

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>
ආර්ථික ප්‍රශ්නයත් එක්ක සභා වාර්තාව පුළුවන් තරම් කෙටි කරනවානම් හොදයි. සභාවට කොළවලින් හරි ඉතිරියක් වෙනවා. වැවේගම ප්‍රශ්නය ගැන බලන්න සභාපතිතුමා ආවේ නෑ. ඒ ගැන කණගාටු වෙනවා.

<u>ගරු මන්ත්‍රී ජී.කේ.පී ෆොන්සේකා මිය</u>
ඉඟුරුඔය දුම්රිය හරස් මාර්ගය ඉදිකිරීම සම්බන්ධයෙන් ස්තූතිය පළ කරනවා. අවුරුදු 70 ක පමණ සිට තියන ප්‍රශ්නයක් ගරු මහින්දානන්ද මැතිතුමා මැදිහත් වෙලා ගරු සභාපතිතුමාගේ විශාල දායකත්වයක් දරලා තමා මේ දේ සකස් කරලා දුන්නේ. ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා ඇතුළු සියළුම කාර්ය මණ්ඩලයටත් ගරු මහින්දානන්ද ඇමතිතුමාටත් විශේෂ ස්තූතියක් මේ අවස්ථාවේදී පුද කරනවා.